**අයගම ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**---------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 28 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට අයගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල සැපයුම් හා උපකරණ මිලදී ගැනීම් රු. 500,975 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | අදාල ගැලපීම් කර ගිණුම් නිවැරදි කළ යුතුවේ. | 2019 වසරේ සිට ගිණුම් සකස් කිරීමේදී නිවැරදි ගිණුම් ක්‍රමය භාවිතා කර ගිණුම් තැබීම කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල මන්ත්‍රී ඉන්ධන දීමනා රු. 22,500 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | අදාල ගැලපීම් කර ගිණුම් නිවැරදි කළ යුතුවේ. | උපචිත පදනම මත ගිණුම් නොතැබීමෙන් සිදු වූ වරද සමුච්චිත අරමුදලට ගැලපීමෙන් නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | හිඟහිටි වැටුප් ප්‍රතිපූර්ණ ආදායම රු. 44,530 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | අදාල ගැලපීම් කර ගිණුම් නිවැරදි කළ යුතුවේ. | 2019 වර්ෂයට අදාල ගිණුම සකස් කරන විට ගැලපීමට සටහන් කර ගතිමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කඩකුලී රු. 157,300 ක් ගිණුම්ගත කර නොතිබුණි. | අදාල ගැලපීම් කර ගිණුම් නිවැරදි කළ යුතුවේ. | ගිණුම්ගත නොවූ හිඟ කඩකුලිය 2019 වසරේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ඉ) | ප්‍රධාන අමාත්‍යාංශය වෙත පියවිය යුතු අත්තිකාරම් වලින් රු. 1,200,000 ක උසාවි දඩ හා මුද්දර ගාස්තු අඩු කරගෙන තිබුණද, එම වටිනාකම අත්තිකාරම් ගිණුමට ගැලපීම් කර නොතිබුණි. | අදාල ගැලපීම් කර ගිණුම් නිවැරදි කළ යුතුවේ. | 2019 වර්ෂයේදී පෙර වසරේ වැරදි නිවැරදි කිරීම් යටතේ ගිණුම්වලට ගැලපීමට සටහන් කර ගතිමි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ දෙක සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු. 1,709,954 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | අදාල ගැලපීම් කර ගිණුම් නිවැරදි කළ යුතුවේ. | මුද්දර ගාස්තු ආදායම ඇස්තමේන්තු ආදායමක් සේ හඳුනාගන්නා අතර මෙම ආදායමට අධි වෙන්කිරීම් හා ඌන වෙන්කිරීම් ඇතිනම් හඳුනාගෙන ශේෂයන් නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (උ) | සමාලෝචිත වර්ෂයට අදාල උපචිත වියදම් රු. 167,501 ක් සඳහා ණයහිමි වෙන්කිරීම සිදුකර නොතිබුණි. | අදාල ගැලපීම් කර ගිණුම් නිවැරදි කළ යුතුවේ. | 2019 වසරේ ගිණුම් සකස් කිරීමේදී වර්ෂයට අදාල සියළුම ණයහිමියන් හඳුනාගෙන ගිණුම් සකස් කිරීමට කටයුතු කරමි. |
| (ඌ) | 2018 වර්ෂයේ විගණන ගාස්තු සඳහා අවස්ථා දෙකකදී පිළිවෙලින් රු. 150,000 ක් සහ රු. 200,000 ක් ණයහිමි වෙන්කිරීම් සිදුකර තිබුණි. | අධි වෙන්කිරීම් සඳහා අදාල ගැලපීම් සිදුකළ යුතුයි. | 2019 වසරේදී අධි වෙන්කිරීම් යටතේ ගලපා ගිණුම් නිවැරදි කිරීමට පියවර ගනිමි. |

## 1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලයට අදාල රු. 1,287,658 ක් වූ ඉකුත් තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | VAT/NBT මුදල් දේශීය ආදායම් දෙපාර්තුමේන්තුවට යැවූ නමුත් තැන්පත් ලේඛනයෙන් ඉවත් කර නොමැත. මෙම මුදල් ඉවත් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 05 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | සභාව සතු සියළු වාහන වල ඉන්ධන දහන පරීක්ෂාව චක්‍රලේඛ ප්‍රකාරව සිදුකළ යුතුවේ. | චක්‍රලේඛ ප්‍රකාරව ඉදිරියේදී ඉන්ධන දහන පරීක්ෂාව සිදු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 1,772,038 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,124,181 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 658,000 | 1,233,134 | 1,014,333 | 193,606 | 626,300 | 848,489 | 871,840 | 149,210 |
| (ii) | කුලී | 6,221,170 | 4,656,723 | 4,512,532 | 147,376 | 3,974,775 | 4,133,380 | 4,142,544 | 3,240,504 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 286,410 | 321,511 | 264,971 | 3,950 | 208,360 | 330,977 | 309,567 | - |
| (iv) | වෙනත් ආදායම් | 3,849,450 | 5,057,487 | 6,368,402 | 7,040,838 | 1,677,200 | 5,509,458 | 2,022,974 | 8,408,065 |

### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වනවිට වරිපනම් ඒකක 105 කින් අයවිය යුතු හිඟ ශේෂය රු. 45,687 ක් විය. | හිඟ වරිපනම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 136,621 ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුල වර්ෂ 05 ට වඩා පැරණි ඒකක 111 කින් අයවිය යුතු එකතුව රු. 29,933 ක් ඇතුලත් වී තිබුණි. | හිඟ අක්කර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | සභාව විසින් ක්‍රියාත්මක ජල ව්‍යාපෘති 10 කට අදාලව හිඟ ජල ගාස්තු රු. 206,563 ක් විය. ඉන් රු. 133,984 ක් මාස 06 කට වඩා වැඩි කාලයක සිට හිඟව පවතී. | හිඟ ජල බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 බලපත්‍ර ගාස්තු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ලබා ගැනීමට ගාස්තු ගෙවා තිබූ ආයතන 180 ක් සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | වෙළඳ බලපත්‍ර ලබා ගතයුතු සියළු ආයතන වෙත අදාල රෙගුලාසි වලට අනුකූලව බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 වසරේ සියළුම ආයතන සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි ප්‍රකාරව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොමැති ආයතන හඳුනා ගැනීම සඳහා වාර්ෂික සමීක්ෂණයක් හෝ වෙනත් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. බල ප්‍රදේශය තුල පිහිටි බ්ලොක් ගල් හා කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන ආයතන 04 ක් අදාල බලපත්‍ර ලබාගෙන නොමැති වීම හේතුවෙන් රු. 17,600 ක ආදායමක් අහිමි වී තිබුණි. | පරිසර බලපත්‍ර ලබාගෙන නොමැති ආයතන හඳුනාගැනීම සඳහා විධිමත් සමීක්ෂණයක් සිදුකළ යුතු අතර, විධිමත්ව බලපත්‍ර ලබාදීමට කටයුතු කළ යුතුවේ. | සම්පූර්ණ බල ප්‍රදේශයම ආවරණය වන පරිදි 2019 මැයි 07 දින පරිසර බලපත්‍ර ලබා ගතයුතු ස්ථාන හඳුනාගැනීමේ සමීක්ෂණයක් සිදු කිරීමට සැලසුම් කර ඇති අතර, විගණනයේදී හඳුනාගන්නා ලද කොන්ක්‍රීට් නිෂ්පාදන ආයතන වලට බලපත්‍ර ලබා ගන්නා ලෙස දැනුවත් කරමින් ලිපි යොමු කර ඇත. |

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 1,924,333 ක් වූ අතර, ලැබිය යුතු මුද්දර ගාස්තු 2019 ජනවාරි වනවිටත් හඳුනාගෙන නොතිබුණි. | ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු හඳුනාගෙන අයකර ගතයුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ ඇති වූ හදිසි ආපදා තත්ත්වයක් නිසා තක්සේරු කුලිය ගෙවීමේ පදනම මත අයගම පොලිස් ස්ථානය මාස 06 ක කාලයකට පවත්වාගෙන යාම සඳහා බස් නැවතුම්පලෙහි ඉහල මහල ලබා දී තිබුණ ද, කාල සීමාව අවසන් වීමෙන් පසුව ගොඩනැගිල්ල ආපසු සභාව වෙත භාරදී නොතිබුණි. 2017 වර්ෂයට අදාල බදු කුලිය | අදාල හිඟ බදුකුළිය අයකරගත යුතුවේ. | උක්ත කරුණට අදාලව 2017 වර්ෂයේ හිඟ මුදල මේ වනතෙක් ගෙවා නොමැති අතර, අයගම පොලිස් ස්ථානය පෙර පැවති ස්ථානය වෙත ගෙනයාම සුදුසු බව පිළිබඳ ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් වාර්තාවක් ඉල්ලා යවා ඇති අතර, එම වාර්තාව ලැබෙන තුරු |

| | |
|---|---|
| හා විදුලිය වෙනුවෙන් එකතුව රු. 114,300 ක් අයවිය යුතුව පැවතුණි. | ගොඩනැගිල්ල පෙර මාසික මුදලටම ලබා දීමට මහා සභාව තීරණය කර ඇත. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිරන කසළ කලවාන ප්‍රාදේශීය සභාවේ කසළ බැහැර කරන ස්ථානය වෙත බැහැර කලද විධිමත් කසළ කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණි. | විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම සඳහා සුදුසු ඉඩමක් නොමැති බැවින්, එම කටයුත්ත කිරීමේ ගැටළුවක් ඇත. දැනට සභා බල ප්‍රදේශය තුළ එකතු කරන කසළ වලින් නොදිරන කසළ අයගම සතිපොල තුල ස්ථානයක ගබඩා කරන අතර, දිරන කසළ කලවාන කසළ බැහැර කරන ස්ථානයට ගෙන ගොස් විධිමත්ව බැහැර කරනු ලබයි. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 දෙසැම්බර් වනවිටත් සකස් කර නොතිබුණි. | දිගුකාලීන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | එම සැලසුම් සකස් කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරන බව දැනුම් දෙමි. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තනතුරු 05 කට අදාලව පුරප්පාඩු 08 ක් පැවතුණු අතර ලේකම් තනතුර, සංවර්ධන නිලධාරීන් හා තාක්ෂණික නිලධාරී (සිවිල්) පුරප්පාඩු කාර්යය මණ්ඩලයට ඇතුලත් වී තිබුණි. | තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු තනතුරු වන ලේකම්, සංවර්ධන නිලධාරී, තාක්ෂණ නිලධාරී (සිවිල්), බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු, පෙර පාසල් ගුරු තනතුරු සඳහා මේ වනතෙක් පත්වීම් ලබා දී නොමැතිකම හේතුවෙන් උක්ත තනතුරු 8 පුරප්පාඩු වී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ස්ථාන මාරුවී ගිය හා සේවය අතහැර ගිය සේවකයින් තිදෙනෙකුට අදාල එකතුව රු. 25,200 ක් වූ හිඟ ණය ශේෂය 2018 දෙසැම්බර් 31 දින වනවිටත් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | හිඟ ණය ශේෂ පියවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාල ණය ශේෂ පියවා ගැනීමට කටයුතු කරමින් පවතියි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 06 කට අදාලව එකතුව රු. 718,500 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | සැලසුම් සහගත ලෙස ප්‍රතිපාදන වෙන්කිරීමටත් එම ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුවේ. | සැලසුම් කල ඇතැම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 16 කට අදාලව එකතුව රු. 23,622,700 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 62 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රතිශතයක් ඉතිරි වී තිබුණි. | සැලසුම් සහගත ලෙස ප්‍රතිපාදන වෙන්කිරීමටත් එම ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුවේ. | පෙර වසරේ වියදම් සලකා බලා ප්‍රතිපාදන වෙන් කලද, අපේක්ෂිත තරම් වියදම් නොවීම නිසා ඉතිරිවීම් සිදුව ඇත. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කළ යුතුවේ. | 2019 මාර්තු 26 වන දින විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා ඇත. |

**4.3 නොවිසඳී ඇති නිරීක්ෂණ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වටිනාකම රු. 845,000 ක් වූ යන්ත්‍ර 03 ක් හා වටිනාකම හඳුනානොගත් කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක් දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යයව පැවතුණි. | යන්ත්‍ර අළුත්වැඩියා කිරීම ඵලදායී නම් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ විධිමත්ව අපහරණය කිරීමට හෝ කටයුතු කළ යුතුවේ. | අළුත්වැඩියා කිරීමටත්, එසේ නොහැකි යන්ත්‍ර වෙන්දේසි කිරීමටත් කටයුතු කරමි. |